www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජී-8 නායකයෝ ලෝක අර්බුදය පිලිබඳ එකඟතාවකට පැමිනීමට අසමත්වෙති

## G 8 leaders fail to reach agreement on global crisis

ස්ටෙෆන් ස්ටේන්බර්ග් විසිනි
2009 ජුලි 11

ප්‍රධාන කාර්මික රටවල ජී-8 කන්ඩායමේ නායකයෝ මේ වසරේ සමුලුව අවසානයේ සිය ඡායාරූප හමුවට පෙලගැසී සිටිමින්, ඉතාලියේ අක්විලා නගරයේ දී පැවති තමන්ගේ සාකච්ඡා පිලිබඳව ඉතා හොඳ මුහුනක් පෙන්වීමේ උත්සාහයක යෙදී සිටියහ.

එක්සත් ජනපද ජනාධිපති බරක් ඔබාමා පාරිසරික ප්‍රතිපත්ති පිලිබඳව ඓතිහාසික එකඟත්වයක් ගැන කථා කල අතර ජර්මන් චාන්සලර් ඇන්ජිලා මර්කෙල් සමුලුවේ දී "සැලකිය යුතු ප්‍රගතියක්" අත් කර ගත් බව ප්‍රකාශ කලාය. ඇත්ත වශයෙන්ම පසුගිය තෙදින තුල නිවේදනය කල තීන්දු බොහොමයක් හිස් හා එක පැත්තකට හෝ බර නොවූ ඒවා විය. පොදුවේ ගත් කල එමගින් සලකුනු කලේ පූර්වයෙන් පැවති ජී-8 සමුලුවල දී එකඟත්වයකට පැමිනි එහෙත් ක්‍රියාවට නොනැගුනු ආස්ථානයන්ගෙන් පවා පසුබැසීමකි.

### දේශගුනික වෙනස්කම්

සමුලුව තුල දී හරිතාගාර වායු සීමා කිරීම මත ඒකාබද්ධ තීන්දුවකට පැමිනීමට ගත් උත්සාහය, සංවර්ධිත කාර්මික රටවල්, විශේෂයෙන්ම එක්සත් ජනපදය, දේශගුනික ඉලක්ක තම ආර්ථිකයන්ගේ වර්ධනය අඩාල කිරීම සඳහා යොදාගන්නා බව කියා සිටිමින් ඉන්දියාව, චීනය හා බ්‍රසීලය වැනි නැගී එන ආර්ථිකයන් විසින්, වලක්වනු ලැබී ය. අක්විලා හි ජී-8 සාකච්ඡාවන්ගේ දෙවන දිනයට සහභාගී වන ලෙස එම රටවල් තුනේම නියෝජිතයන්ට ඇරයුම් කර තිබුනි.

2050 වන විට හරිතාගාර වායු විමෝචනය සියයට 80 කින් කපා හැරීමට සමුලුව හමුවේ ඉදිරිපත්වූ ආරම්භක යෝජනාව, නිවේදනය කර පැය කිහිපයක් තුල වැලලී ගියේය. යෝජනාව "අභිලාෂවත්" බව කැනඩාව කියා සිටි අතර එයට ඉලක්කය කරා ලඟාවිය නොහැකි බව රුසියාව කියා සිටියේය.

ඒ කාරනයේ දී සමුලුව 2050 වන විට හරිතාගාර වායු විමෝචනය අඩකින් පහත දැමීමට එකඟ වුව ද, එහි අවසන් යෝජනාව විස්තරාත්මක නොවීම කැපී පෙනෙයි. අඩු කිරීමට යොදා ගන්නේ කුමන සඳහන් වර්ෂය ද යන්නේ දී එය අපැහැදිලිය. ආරම්භක ලක්ෂ්‍යය සාමාන්‍යයෙන් යොදා ගන්නා පාදක රේඛාව වන 1990 ට පසුව නම්, විමෝචනය ඉහල යාමට පටන් ගත්තේ එම වසරේ පටන් යයි බොහෝ රටවල් සලකන තතු හමුවේ ඉලක්කය අලුතින් කරන කපාහැරීම් වැඩියෙන් අන්තර්ගත කර ගනී. නවතම එකඟත්වය, 2020 වන විට $CO_2$ විමෝචනය සියයට 20 කින් අඩුකිරීමට යෝජනා කල, 2007 මාර්තු යුරෝපීය සංගමයේ ඉලක්කයටත් වඩා බොහෝ පහතට වැටුනි.

ජී-8 නායකයෝ, දේශගුනික ඉලක්ක සඳහා මුදල් සම්පාදනය කරන්නේ කෙසේද යන්න පෙන්සිල්වේනියාවේ පිට්ස්බර්ග්හි සැප්තැම්බර් මාසයේ දී පවැත්වීමට සැලසුම් කර ඇති ජී-20 සමුලුව තෙක් තීරනය නොකිරීමට ද එකඟවූහ.

දේශගුනික විපර්යාස පිලිබඳව සඳහන් කරමින් එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බාන් කී මූන් ප්‍රගතිය සඳහා "හොඳම අවස්ථාව" ජී-8 විසින් අහිමි කර ගෙන ඇතැයි පැමිනිලි කලේය.

### කෘෂිකාර්මික ආධාර

සමුලුව අවසානයේ සාර්ථකත්වය පිලිබඳ කථා වලින් බොහොමයක් මාධ්‍යගත වූයේ ඌන සංවර්ධිත ජාතීන්ට කෘෂිකාර්මික ආධාර වශයෙන් ඉදිරි තෙවසර සඳහා ඩොලර් බිලියන 20 ක් සැපයෙන අරමුදලක් පිහිටුවීමයි. ආරම්භක සමුලු ප්‍රකාශනය සඳහන් කලේ ඇතුලත් වන මුදල ඩොලර් බිලියන 15 ක් වන බව යි. අවසානයේ දී දුගී ජාතීන්ට හා මහාද්වීපයන්ට, විශේෂයෙන්ම අප්‍රිකාවේ, ආධාර කිරීමට සමුලු සාමාජිකයින් අතිරේක බිලියන 5 ක් සඳහා එකඟත්වය පලකිරීම, සැලකිය යුතු ප්‍රගතියකි.

බිලියන 20 ක මුදල ඌන සංවර්ධිත ජාතීන්ගේ දුප්පත් කම තුරන් කිරීම සඳහා කිසි සෝත් ම සෑහෙන්නේ නැත. සමුලුවට සතියකට පෙර නිකුත් කල බ්‍රිතාන්‍යයේ චැරිටි ඇක්ෂන් ඒඩ් සංවිධානයේ වාර්තාවක සඳහන් වූයේ ලෝකයේ මිනිසුන්ගෙන් එක් බිලියනයක් සාගතයට ගොදුරු වන බවයි. ජී-8 සමුලුවේ තීරන වලට "සංවර්ධනය වන රටවල ජීවිතය හා මරනය අතර වෙනස ඇත්ත වශයෙන්ම තීරනය කල හැකි වනු ඇත." යනුවෙන් එය ප්‍රකාශ කලේය.

ගෝලීය ආර්ථික අර්බුදය දුබල ම හා මායිමේ ම ඇති ආර්ථිකයන් කෙරෙහි සුවිශේෂව කුරිරු බලපෑමක් ඇති කර තිබෙන තතු හමුවේ, ඉතාලියේ දී නිවේදනය කල නාමික මුදල් ප්‍රමානය, මිලියන සිය ගනනක් වන මෙම මිනිසුන් තව තවත් දුගී භාවයට හා සාගතයට ඇද දැමීම සහතික කරනු ඇත. අප්‍රිකාවේ හා ආසියාවේ වැඩි කොටසක් ප්‍රාග්ධනය නොමැතිකමේ පිපාසයෙන් පෙලෙද්දී හා ඊනියා තෙවැනි ලෝකයේ රටවල නිර්යාත වෙලඳපොලවල් මිරිකී යද්දී පවා ප්‍රාග්ධනයේ ඒකාධිකාරය පවත්වාගෙන යන අධිරාජ්‍යවාදී බලවතුන් සිය බැංකු පද්ධතීන්ට ඇප දීම අරමුනු කරගෙන වැඩ කරති.

තව ද, එක්සත් ජනපදය පොරොන්දු වී ඇති බිලියන 3.5 සොච්චම ද ඇතුලුව යොදවන බිලියන 20, කලකට පෙර පොරොන්දු වී එහෙත් මෙතෙක් නොගෙවා ඇති මුදල් ද නැතහොත් අලුතෙන්ම යොදවන මුදල් ද යන වග කෘෂිකාර්මික ආධාර වාර්තාව පැහැදිලි නොකරයි. 2005 වසරේ දී ස්කොට්ලන්තයේ ග්ලෙනීගල්ස්හි පවත්වන්නට යෙදුනු ජී-8 නායක සමුලුවේ දී 2010 වසර වන විට ඌන සංවර්ධිත රටවල් සඳහා බිලියන 50 කට නොඅඩු මුදලක් පොරොන්දු විය. ආර්ථික සහයෝගීතාවය හා සංවර්ධනය සඳහා වූ සංවිධානයට (ඕඊසීඩී) අනුව මෙම ඉලක්කයෙන් සපුරා ඇත්තේ තුනෙන් එකක් පමනි.

## මූල්‍ය හා ආර්ථික ප්‍රතිපත්ති

ආර්ථික අර්බුදය පොරබදන්නේ කෙසේ ද යන්න පිලිබඳව සංයුක්ත එකඟත්වයකට පැමිනීමට ද ජී-8 නායකයන් අසමත් වී තිබේ. අර්බුදය මඟින් මතුකර තිබෙන අන්තරායන් පිලිගන්නා අතර ම සමුලුව 09 දින නිකුත් කල වාර්තාවකින් කියා ඇත්තේ "තත්ත්වය අවිනිශ්චිතව පවත්නා අතර ආර්ථික හා මූල්‍ය ස්ථාවරත්වයට සැලකිය යුතු අවදානම් දැරීමට සිදුව තිබෙන" බවයි.

කෙසේ වෙතත් අර්බුදයට මුහුන දෙන්නේ කෙසේ ද යන්න පිලිබඳව ජී-8 දැඩි ලෙස බෙදී සිටිති. එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍යය, බැංකු හා ව්‍යාපාරික ක්ෂේත්‍රයට අතිරේකව මහා පරිමානයෙන් ප්‍රාග්ධනය එන්නත් කල යුතු යයි කියා සිටින අතර ජර්මනියේ නායකත්වයෙන් යුත් යුරෝපීය රටවල් ගනනාවක් ආන්ඩුවල අයවැය හිඟයන් ඉහල යාමේ අවදානම හා උද්ධමනයේ තර්ජනය මතුකරමින් තවත් උත්තේජක වැඩ සටහන්වලට විරුද්ධ වෙති. කාර්මික නිර්යාතයන් මත යැපෙන ආර්ථිකයක් සහිත ජර්මනිය, එක්සත් ජනපද ගෙවුම් ශේෂය ඉහල නැඟ, යුරෝවට සමානුපාතිකව ඩොලරයේ අගය තව දුරටත් පිරිහී යාම මඟින්, එක්සත් ජනපදය හා අනෙකුත් ප්‍රධාන වෙලඳපොලවලින් ජර්මන් අපනයනවල තරගකාරිත්වය නැතිව යාමේ අවදානම ගැන විශේෂයෙන් කනස්සල්ලට පත්ව සිටියි.

අර්බුදයට ප්‍රතිචාර දැක්විය හැකි සම්බන්ධීකරනය කල ප්‍රතිපත්තියකට එලඹීමට ද ජී-8 නායකයෝ අසමත් වූහ. ස්වාධීන ආන්ඩු සිය ජාතික විසඳුම් අනුගමනය කිරීමේ දී එකිනෙකා සමඟ සමීපව කටයුතු කලයුතු යයි ඉල්ලා සිටීමට වැඩි යමක් ඔවුන්ට කල නොහැකි විය. ඒකාබද්ධ ප්‍රකාශනය "ආර්ථික කොන්දේසි හා රාජ්‍ය මූල්‍ය මත රඳා පවත්නා අවසන් ක්‍රියාමාර්ග, විවිධාකාර වනු" ඇතැයි සඳහන් කරමින් ඒකාබද්ධ ප්‍රකාශනය එකඟත්වයේ නොසෑහෙන කම පිලිගෙන තිබේ.

© www.wsws.org